GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2026.01.07

මාධ්‍ය නිවේදනය

**නිදහස් සෞඛ්‍ය සේවාවේ සහ වෛද්‍යවරුන්ගේ ගැටලු විසඳීම සඳහා රජය විසින් ලබා දුන් එකඟතා ක්‍රියාත්මක නොවීම පිළිබඳ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ හදිසි මධ්‍යම කාරක සභා රැස්වීමේ තීරණ.**

පසුගිය නොවැම්බර් මාසයේදී ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2026 වර්ෂය සඳහා වන අයවැය යෝජනාවලිය තුළ, මෙරට සෞඛ්‍ය සේවයේ සහ වෛද්‍යවරුන්ගේ සැබෑ ගැටලු හඳුනාගනිමින් ඒවාට විසඳුම් ලබාදීම සඳහා අවශ්‍ය කෙටි කාලීන සහ දීර්ඝ කාලීන ප්‍රතිපත්ති හෝ ක්‍රියාමාර්ග කිසිවක් අන්තර්ගත නොවීම තුල සෞඛ්‍ය පද්ධතිය සහ සෞඛ්‍ය සේවකයින් තුල බරපතල නොසන්සුන්තාවයක් සහ විරෝධතාවයක් ඇති විය.

රෝහල් පද්ධතියේ ගැටලු හඳුනාගනිමින් නිදහස් සෞඛ්‍ය සුරක්ෂිත කිරීම උදෙසා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් අවස්ථා ගණනාවකදි තොරතුරු සහ යෝජනා ලබා දී තිබියදීත් අයවැය ලේඛනය තුල නිදහස් සෞඛ්‍ය සේවාව නොසලකා හැර තිබිම කිසිසේත් නිහඬව සිටිය හැකි ප්‍රවණතාවයක් නොවේ.

ඒ අනුව සෞඛ්‍ය සේවාවේ සහ වෛද්‍යවරුන්ගේ සැබෑ ගැටලු සඳහා විසඳුම් ලබා දීමට බල කරමින් වෘත්තිය ක්‍රියාමාර්ග ගණනාවක් දියත් කිරීමට සිදුවූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වෛද්‍යවරුන්ට ආර්ථික යුක්තිය ඉටු කිරීම සහ යහපත් වෘත්තීය පරිසරයක් බිහිකිරීම තුල රට තුල වෛද්‍යවරුන් රැදි සිටිම දිරිමත් කරන ශක්තිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා කාල රාමුවක් ද සහිතව එකඟතාවය ලිඛිතව ලබාදීමට සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් කටයුතු කරන ලදී.

වෛද්‍යවරුන්ගේ DAT දීමනාව යාවත්කාලීන කිරීම, 22/99 චක්‍රලේඛයට අනුකූලව ප්‍රවාහන ගැටලු විසඳිම, අමතර රාජකාරි දීමනාව ස්ථාවර දීමනාවක් බවට පත් කිරීම සහ සියලු කාණ්ඩවල වෛද්‍යවරුන් ඇතුළත් කර ගනිමින් ශ්‍රී ලංකා වෛද්‍ය සේවය නමින් සුවිශේෂී සේවා කාණ්ඩයක් බිහිකිරීම සම්බන්ධයෙන් වු රජයේ ප්‍රතිපත්තිමය එකඟතාවය සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේදි ප්‍රකාශයට පත් කරන ලදී.

එම ප්‍රතිපත්තින් ක්‍රියාවට නැංවීම සඳහා මුදල් අමාත්‍යාංශය සමඟ අවශ්‍ය සාකච්ඡා 2026.01.05 වැනි දින සිට ආරම්භ කිරීමටත්, මාස 03 ක කාලයක් තුල විසඳුම් ප්‍රකාශයට පත්කිරීමටත් ලිඛිතව එකඟතාවය ලබාදෙන ලදී.

එහෙත් මේ වන විට එම එකඟතාවයන් කඩ කරමින් රජය, සෞඛ්‍ය අමාත්‍යවරයා සහ සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු කරමින් සිටින බව නිරීක්ෂණය වන අතර වෛද්‍යවරුන් ඇතුලු වෘත්තීයවේදින් රවටමින් නිදහස් සෞඛ්‍ය සේවාව දුර්වල කරමින් ප්‍රතික්ශේපිත දේශපාලන සංස්කෘතිය අනුගමනය කිරීමේ ප්‍රවණතාවයක් ක්‍රියාත්මක වන බව තහවුරු වෙමින් පවති.

සෞඛ්‍ය පද්ධතිය තුළ ඇති ගැටලු විසඳීමේදී වඩා නම්‍යශීලී සහ සාධාරණ පිළිවෙතක් අනුගමනය කරමින් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ කටයුතු කරන පසුබිමක රජයේ, සෞඛ්‍ය අමාත්‍යවරයාගේ ඇතුළු වගකිවයුත්තන්ගේ වෘත්තිමය නොවන සහ විශ්වාසය බිඳවැටෙන සුලු හැසිරීම සහ වැඩපිළිවෙලත්, උද්ගතවී ඇති ප්‍රවණතාත් සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණ ගැනීම සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ හදිසි මධ්‍යම කාරක සභා රැස්වීමක් අද දිනයේදි පැවැත්වෙන ලදී.

එහිදි රජයේ සහ සෞඛ්‍ය අමාත්‍යවරයාගේ වගකීම් විරහිත සහ විශ්වාසය කඩවන හැසිරීම සම්බන්ධයෙන් සියලු දෙනාගේ බරපතල අප්‍රසාදය පල කරන ලදී.

මෙම ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අද දින සෞඛ්‍ය අමාත්‍යවරයා සමඟ හදිසි සාකච්ඡාවකට ආරාධනා කර ඇති අතර එහිදි, සියලු කාණ්ඩවල වෛද්‍යවරුන් ඇතුළත් කර ගනිමින් ශ්‍රී ලංකා වෛද්‍ය සේවය නමින් සුවිශේෂී

සේවා කාණ්ඩයක් බිහිකිරීම සඳහා කැබිනට් පත්‍රිකාවට අනුමැතිය ලබා දීමට, වෛද්‍යවරුන්ගේ DAT දීමනාව යාවත්කාලීන කිරීමට, 22/99 චක්‍රලේඛයට වෛද්‍යවරුන් අන්තර්ග්‍රහණය කිරීමට සහ අමතර රාජකාරි දීමනාව ස්ථාවර දීමනාවක් බවට පත් කිරීමට අදාල ක්‍රියාමාර්ග කාලරාමුවක්ද සහිතව ප්‍රකාශයට පත් කල යුතු බව මධ්‍යම කාරක සභාවේ තීරණයයි.

එමෙන්ම ඒ සඳහා අවශ්‍ය සාකච්ඡා මුදල් අමාත්‍යාංශය සමඟ ආරම්භ කිරීම සඳහා නිශ්චිත කාල රාමුවද ප්‍රකාශයට පත් විය යුතුය.

මෙම ගැටලු සඳහා එළඹෙන 2026.01.12 දින වන විට නිශ්චිත විසඳුම් ප්‍රකාශයට පත් නොවන්නේ නම් ඉන් ඔබ්බට ඕනෑම ආකාරයක වෘත්තීය සමිති ක්‍රියාමාර්ග වෙත එළඹීමට මධ්‍යම කාරක සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදි.

එහිදී, පසුගිය නොවැම්බර් මාසයේදී ක්‍රියාත්මක කර තාවකාලිකව අත්හිටුවන ලද වෘත්තීය සමිති ක්‍රියාමාර්ග මාලාව නැවත ආරම්භ කිරීමටත් ඊට අමතරව නව වෘත්තීය ක්‍රියාමාර්ග වලට එළඹීමටත් තීරණය වූ අතර ගැටලු විසඳීම සඳහා රජය සහ සෞඛ්‍ය අමාත්‍යවරයා සද්භාවයෙන් මැදිහත් නොවන්නේ නම් ඕනෑම මොහොතක දීපව්‍යාප්ත වැඩවර්ජනයක් ප්‍රකාශයට පත් කිරීමට විධායක සභාවට බලය පැවරීමට මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරන ලදී.

රජයේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වත්මන් හැසිරීම තුල, වත්මන් පාලනයේ නිදහස් සෞඛ්‍ය සේවාව සුරක්ෂිත කිරීමේ සටන් පාඨයේ සහ ප්‍රතිපත්තියේ සද්භාවය පිළිබඳ බරපතල අවිනිශ්චිතතාවයක් මතු වී ඇති අතර රෝහල් පද්ධතියේ මානව සම්පත් අර්බුදය, ඖෂධ අර්බුදය ඇතුලු ගැටලු සඳහා කාල රාමුවක් සහිත උපායමාර්ගික සැලැස්මක් ක්‍රියාත්මක කිරීමේ ජාතික අවශ්‍යතාවයන් නොසලකා හරිමින් ඒවායෙන් පැන යාමට ආණ්ඩුව කටයුතු කරන්නේ නම්, නිදහස් සෞඛ්‍ය සුරක්ෂිත කිරීම උදෙසා අවශ්‍ය ඕනෑම ක්‍රියාමාර්ගයක් ගැනීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය පසුබට නොවන බවද අවධාරණය කරමු.

ස්තුතියි.
මීට විශ්වාසී,

වෛද්‍ය ප්‍රභාත් සුගතදාස,
ලේකම් .

වැඩිදුර විස්තර රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මාධ්‍ය කමිටුවෙන් -

| | | |
|---|---|---|
| වෛද්‍ය චමිල් විජේසිංහ(මාධ්‍ය ප්‍රකාශක) | - | 0717080041 |
| වෛද්‍ය පාලිත රාජපක්ෂ | - | 0718480300 |
| වෛද්‍ය අජන්ත රාජකරුණා | - | 0766736296 |
| වෛද්‍ය වසන්ත වීරසූරිය ආරච්චි | - | 0773526063 |
| වෛද්‍ය හංසමාල් වීරසූරිය | - | 0776549339 |
| වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ | - | 0777829001 |
| වෛද්‍ය වාරුනි කොහොඹන්ගේ | - | 0714410467 |
| වෛද්‍ය අන්ෆාස් ෆාරුක් | - | 0771115117 |
| වෛද්‍ය ආර්. තනිගවාසන් | - | 0772369608 |
| වෛද්‍ය ප්‍රසාද් කොළඹගේ | - | 0716812160 |
| වෛද්‍ය සංජීව තල්ගහගොඩ | - | 0716173330 |